# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 14,568 — 1965 නොවැම්බර් 25 වැනි බ්‍රහස්පතින්දා — 1965.11.25

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV වැනි කොටස — පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

ඇල්.ඕ.ඕ 33/65

### 1965 අංක 15 දරන ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් (සංශෝධන) පනත

**1 වැනි වගන්තිය යටතේ ආඥාව**

1965 අංක 15 දරන ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ 1 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම, එකී පනත ක්‍රියාත්මක විය යුතු දිනය වශයෙන් 1965 දෙසැම්බර් මස හය වැනි දිනය මේ ආඥාවෙන් නියම කරමි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965.11.24 වැනි දින,
කොළඹ දීය.

11-1239/1

---

එල්.ජී.—බී. 28/65.

### 1963 අංක 9 දරණ ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් (සංශෝධන) පනත

**1(3) වන වගන්තිය යටතේ වූ ආඥාව**

1963 අංක 9 දරන ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් (සංශෝධන) පනතෙහි 1(3) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුචෙල්වම් වන මම, 1965 දෙසැම්බර් මස හය වන දිනය ඉහත කී පනතෙහි 9 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක විය යුතු දිනය වශයෙන් මෙම ආඥාවෙන් නියම කරමි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 නොවැම්බර් මස 24 වන දින,
කොළඹ දී ය.

11-1239/2

---

එල්.ජී.—බී. 28/65.

### ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත

**39අ (4) වන වගන්තිය යටතේවූ ආඥාව**

1963 අංක 9 දරන ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 39අ වගන්තියෙහි (4) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුචෙල්වම් වන මම, 1965 දෙසැම්බර් මස හයවන දින සිට ඉහත කී 39අ වගන්තියෙහි (1) වන උප වගන්තියේ විධිවිධාන මෙහි උපලේඛනයෙහි නිශ්චිත වී සඳහන් ඡන්දදායක ප්‍රදේශවල සෑම ඡන්දදායක කොට්ඨාශයකට ම අදාල විය යුතු යයි මෙම ආඥාවෙන් ප්‍රකාශ කරමි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 නොවැම්බර් මස 24 වන දින,
කොළඹ දී ය.

#### උපලේඛනය

සෑම මහා නගරයක්.
නගර සභාවක් පිහිටුවා ඇති සෑම නගරයක්.
සුළු නගර සභාවක් පිහිටුවා ඇති සෑම නගරයක්.

11—1239/3

---


ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි.

895—— ආර් 10473—5,300 (65/11)